# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

''මිහිකත මැදුර'' ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர" காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல. ☎ 011 279 7400
"Mihikatha Medura" Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla 🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No } LCGD/PI/LDO/1/58

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2026.03.30

චක්‍රලේඛ අංක - 2026/02

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්

සියලුම පළාත්/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

<u>දිට්වා සුළි කුණාටුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම</u>

2025 වර්ෂයේ නොවැම්බර් මස ඇති වූ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ගංවතුර, නායයෑම් සහ අනෙකුත් ආපදා තත්ත්වයන් මත පූර්ණ නිවාස හානි වූ පවුල් සහ නායයෑමේ අධි අවදානම් ප්‍රදේශවල පදිංචි පවුල් නැවත පදිංචි කිරීම සඳහා රජය විසින් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

02. මේ යටතේ තමන් සතුව නව නිවසක් ඉදිකිරීමට සුදුසු ඉඩමක් නොමැති ප්‍රතිලාභීන් වෙත නැවත පදිංචි කිරීම සඳහා ඉඩම සපයා දීමේ දී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතුය.

03. හඳුනාගත් රජයේ ඉඩම් අපදා සහන සේවා මාර්ගෝපදේශ අනුව සුදුසු ප්‍රතිලාභීන් තෝරා නිවාස කඩිනමින් ඉදිකිරීමට හැකිවන පරිදි භාරදීමේ ලේඛනයක් මගින් තාවකාලිකව බැහැර කර විධිමත් බැහැර කිරීම් 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ ජනාධිපතිවරයාගේ අනුමැතියට යොමු කිරීම සඳහා මා වෙත යොමු කිරීම.

04. පරිත්‍යාගශීලීන් විසින් මෙම කර්තව්‍යය සඳහා ගරු ජනාධිපතිතුමා වෙත පරිත්‍යාග කරන ලද ඉඩම්, ආපදා සහනසේවා මාර්ගෝපදේශ අනුව සුදුසු ප්‍රතිලාභීන් වෙත භාරදීමේ ලේඛනය මගින් තාවකාලිකව බැහැර කර විධිමත් බැහැර කිරීම් 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ ජනාධිපතිවරයාගේ අනුමැතියට යොමු කිරීම සඳහා මා වෙත යොමු කිරීම.


| | | | | |
|---|---|---|---|---|
| ආයතන / நிர்வாகம் / Admin ☎ 011 279 7479 🖷 011 287 3033 | ඉඩම් බදු / காணி குத்தகை / Land Lease ☎ 011 279 7423 🖷 011 287 3110 | පර්යේෂණ හා සංවර්ධන / ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி / Research & Development ☎ 011 2874025 🖷 011 287 3812 | ප්‍රතිපත්ති හා විමර්ශන / கொள்கை மற்றும் விசாரணை / Policy & Investigation ☎ 011 279 7482 🖷 011 2883635 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 🖷 011 286 4462 |

ඊ-මේල් ஈ-மெயில் E-mail - lcglandcom@gmail.com

වෙබ් ලිපිනය இணையம் Web Address - www.landcom.gov.lk

05. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර මගින් බැහැර කර ඇති ඉඩම්, අදාළ එකඟතාවයන් මත සම්පූර්ණ ඉඩම හෝ කොටසක් ප්‍රාදේශීය ලේකම් විසින් ආපදාවට පත් අයවලුන් වෙත බැහැර කිරීම හෝ අපදාවෙන් විපතට පත්වූවන්ට ඉඩම් ලබාදීමේ අවශ්‍යතාවය මත හඳුනාගත් දීමනාපත්‍ර හා බලපත්‍ර ඉඩම් වෙනුවෙන් දැනට ක්‍රියාත්මක "හිමිකම" නිදහස් දීමනාපත්‍ර කඩිනමින් ලබා දීම සඳහා අංක 2025/02 හා 2025.10.14 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව අදාළ වාර්තා හා නිර්දේශ eSlims පද්ධතිය මගින් මා වෙත යොමු කිරීම.

06. මෙම ඉඩම් ලබාදීමේ දී ප්‍රතිලාභීන් තෝරා ගැනීම හා අනෙකුත් නිර්ණායක, ආපදා සහනසේවා මාර්ගෝපදේශ අංක 03/2006 හා ඊට අදාළව ඉදිරියේ දී නිකුත් කරන මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතු බව කාරුණිකව අවධාරණය කරමි.

07. මෙම චක්‍රලේඛය කැබිනට් මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව නිකුත් කරමි.

**චන්දන රණවීර ආරච්චි**

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් -

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
3. ලේකම්, මුදල්,ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
5. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
6. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
7. ලේකම්, පරිසර අමාත්‍යාංශය
8. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
9. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
10. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
11. කොමසාරිස් ජනරාල්, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

12. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
13. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව
14. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
15. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව
16. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
17. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
18. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
19. සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
20. සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
21. සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
22. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
23. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය